22110268

International Baccalaureate®
Baccalauréat International
Bachillerato Internacional

**SINHALESE A1 – STANDARD LEVEL – PAPER 2**
**SINGHALAIS A1 – NIVEAU MOYEN – ÉPREUVE 2**
**SINGALÉS A1 – NIVEL MEDIO – PRUEBA 2**

Monday 16 May 2011 (morning)
Lundi 16 mai 2011 (matin)
Lunes 16 de mayo de 2011 (mañana)

1 hour 30 minutes / 1 heure 30 minutes / 1 hora 30 minutos

---

INSTRUCTIONS TO CANDIDATES

- Do not open this examination paper until instructed to do so.
- Answer one essay question only. You must base your answer on at least two of the Part 3 works you have studied. You may include in your answer a discussion of a Part 2 work of the same genre if relevant. Answers which are not based on a discussion of at least two Part 3 works will not score high marks.
- You are not permitted to bring copies of the works you have studied into the examination room.

INSTRUCTIONS DESTINÉES AUX CANDIDATS

- N'ouvrez pas cette épreuve avant d'y être autorisé(e).
- Traitez un seul sujet de composition. Vous devez baser votre réponse sur au moins deux des œuvres de la 3e partie que vous avez étudiées. Le cas échéant, vous pouvez inclure dans votre réponse une discussion sur une œuvre du même genre littéraire étudiée dans la 2e partie du programme. Les réponses qui ne sont pas basées sur au moins deux des œuvres de la 3e partie n'obtiendront pas une note élevée.
- Vous n'êtes pas autorisé(e) à amener des exemplaires des œuvres que vous avez étudiées dans la salle d'examen.

INSTRUCCIONES PARA LOS ALUMNOS

- No abra esta prueba hasta que se lo autoricen.
- Elija un tema de redacción. Su respuesta deberá basarse en al menos dos de las obras estudiadas en la Parte 3. Se podrán hacer comentarios sobre una obra de la Parte 2 del mismo género, si fuera necesario. Las respuestas que no incluyan una discusión sobre al menos dos obras de la Parte 3 no recibirán notas altas.
- No se permite traer a la sala de examen copias de las obras estudiadas.



© International Baccalaureate Organization 2011

**පහත සඳහන් මාතෘකා අතුරින් එකක් යටතේ වාක්‍ය රචනයක් ලියන්න. 3 වන කොටසේදී ඔබ හදාරා ඇති ග්‍රන්ථ අතුරින් යටත් පිරිසෙයින් දෙකක් වත් ඔබේ පිළිතුරට පදනම් විය යුතුය.**

**අදාළ නම් 2 වන කොටසේ ග්‍රන්ථ අතුරින් එම සාහිත්‍යාංගයටම අයත් කිසියම් කෘතියක් ගැන වුවද පිළිතුරේදී සාකච්ඡා කළ හැකිය. 3 වන කොටසින් යටත් පිරිසෙයින් ග්‍රන්ථ දෙකක් පිළිබඳ සාකච්ඡාවක් පදනම් කොටගෙන නොමැති පිළිතුරුවලට ඉහළ ලකුණු ගණනක් නොලැබෙනු ඇත.**

**සම්භාව්‍ය සාහිත්‍යය**

**1.** **"පැරණි සාහිත්‍ය කෘතීන්හි අන්තර්ගත කථා මෙන්ම ඒවා ඉදිරිපත් කර ඇති ආකාරය ද කතුවරුන්ගේ පරමාර්ථයට බෙහෙවින් අනුකූල වෙයි." ඔබ හැදෑරූ සම්භාව්‍ය සාහිත්‍ය කෘති දෙකක් ඇසුරෙන් විමර්ශනය කරන්න.**

**2.** **සම්භාව්‍ය සාහිත්‍ය කෘතීන්හි භාෂාව යොදාගෙන ඇති ආකාරය පිළිබඳ ඔබ දුටු විශේෂ ලක්ෂණ, ඔබ හදාරා ඇති කෘති දෙකක් සන්සන්දනය කරමින් විමසන්න.**

**නාට්‍ය කලාව**

**3.** **"නාට්‍යයක් මගින් ඉදිරිපත් කෙරෙනුයේ කිසියම් පුවතක් සිදු වූ බව නොව සිදු වූ ආකාරය හා එසේ සිදු වූයේ මන්ද යන්නයි." මෙය කොතෙක් දුරට සත්‍යදැයි ඔබ හදාරා ඇති නාට්‍ය දෙකක් ඇසුරෙන් විභාග කරන්න.**

**4.** **ඔබ අධ්‍යයනය කළ නාට්‍ය කෘති දෙකක ප්‍රධාන තේමාවන් පැහැදිලි කරමින් ඒවා සාර්ථක ලෙස ඉදිරිපත් කිරීම සඳහා නාට්‍යකරුවන් යොදාගෙන ඇති නාට්‍යෝපක්‍රම මොනවාදැයි සන්සන්දනාත්මකව විමසන්න.**

**නවකථාව**

**5.** **ඔබ සිතන පරිදි නූතන නවකථාව සමාජ යථාර්ථය පිළිබිඹු කරන ප්‍රබල මාධ්‍යයක් ලෙස ඉදිරිපත් වීමට වඩාත් උපකාරී වූ විශේෂ සාහිත්‍යමය ලක්ෂණ මොනවාද? ඔබ හදාරා ඇති නවකථා දෙකක් ඇසුරෙන් පැහැදිලි කරන්න.**

**6.** **ඔබ අධ්‍යයනය කළ නවකථා අතුරෙන් ඔබ වඩාත් අගය කරන කෘතීන් දෙක හඳුන්වා ඒවායේ චරිත නිරූපණය කොතෙක් දුරට එම ඇගයීමට හේතු වී ඇද්දැයි නිදසුන් සහිතව දක්වන්න.**

**කාව්‍යය**

**7.** **කාව්‍ය නිර්මාණයක සාර්ථකත්වය සඳහා එහි පද රචනය කොතෙක් දුරට වැදගත් වේද? ඔබ හැදෑරූ කාව්‍ය කෘති දෙකකින් නිදසුන් සපයමින් විමසන්න.**

**8.** **නූතන කවිකිවිඳියන් සිය නිර්මාණවලදී කොතෙක් දුරට හා කොතරම් සාර්ථක ලෙස සමාජ අසාධාරණය කෙරෙහි අවධානය යොමු කර ඇද්ද? ඔබ අධ්‍යයනය කළ නිර්මාණ කෘති දෙකක් පාදක කරගනිමින් සාකච්ඡා කරන්න.**

**කෙටිකතා**

**9.** **"කෙටිකතාවකට විෂය කරගත හැක්කේ සීමිත සිදුවීම් සංඛ්‍යාවක් හා සීමිත චරිත සංඛ්‍යාවක් වුවත් එමගින් ජීවිතය පිළිබඳ පුළුල් විවරණයක් කිරීමට බාධාවක් නොමැත." ඔබ හදාරා ඇති කෙටිකතා කරුවන් දෙදෙනකුගේ නිර්මාණ දෙකක් පාදක කරගනිමින් විග්‍රහ කරන්න.**

**10.** **"කථා වස්තුවක් පාඨක අවධානය රඳවාගත හැකි වන සේ ඉදිරිපත් කිරීම දක්ෂ කෙටිකතා කරුවකුට අපහසු වන්නක් නොවේ." මෙම කියමන පාදක කරගනිමින් ඔබ අධ්‍යයනය කර ඇති කෙටිකතා කරුවන් දෙදෙනකුගේ කතා දෙකක් සන්සන්දනාත්මකව විමසන්න.**

**පොදු ප්‍රශ්න**

**11.** **"ලේඛකයාගේ කාර්යය වන්නේ සමාජය තුළ ජීවත් වන මිනිසුන් මුහුණ පාන ප්‍රශ්න පොදු අත්දැකීම් බවට පත් වන සේ කලාත්මක ලෙස නිරූපණය කිරීමයි." ඔබ හදාරා ඇති කෘති දෙකක් ආශ්‍රයෙන් විමසන්න.**

**12.** **මිනිසාගේ හුදකලා බව හා අසරණ බව ඇතැම් සාහිත්‍ය කෘතිවලින් කොතරම් ප්‍රබල ලෙස හා කවර දෘෂ්ටිකෝණවලින් නිරූපණය කොට ඇද්ද යන්න ඔබ අධ්‍යයනය කළ කෘති දෙකක් ඇසුරු කරගනිමින් විමසන්න.**

**13.** **"සාහිත්‍ය කෘති මගින් මිනිස් සිත පිළිබඳ දුර්වලතා විවේචනයට ලක් වුවද එහි කලාත්මක ගුණය මතු වීමට නම් එය මානව දයාවෙන් යුතුව කෙරෙන විවරණයක් විය යුතුය." ඔබ හදාරා ඇති කෘති දෙකක් ආශ්‍රය කරගනිමින් අදහස් දක්වන්න.**

**14.** **සාහිත්‍යකරුවන් කාන්තා චරිත නිරූපණයේදී මනෝවිද්‍යාත්මක දෘෂ්ටිකෝණයකින් ප්‍රබලව ඉදිරිපත් කර ඇති ආකාරය හා ඒවායේ සාහිත්‍යමය අගය මතු කර ඇති ආකාරය ඔබ හදාරා ඇති කෘති දෙකක් පාදක කරගනිමින් විමසන්න.**